type of duplicity.

Mahinda Rajapakse in his address made another important observation which was more of a warning to the big powers who take upon themselves the responsibility of punishing wrong-doers and ushering in peace to the world. He reminded them of the values and moral standards that other nations possess and adhere to. 'Learn to respect such values and standards in dealing with them,' he said.

This is something that most defenders of democracy and peace seem to have lost sight of. Or have they at last come to a point where it can no more be ignored? Maybe they have realized the value of what Mahimnda Rajapakse tried to tell them. It was not his wisdom, rather the wisdom passed down by the great teacher who showed the world the meaning of compassion and respect for humanity. Human dignity was something he wanted everyone to keep in mind and preserve for the sake of the good and continued happiness of the world beings.

One cannot expect all countries to behave in the same way respecting other's sovereignty and territorial integrity. There ought to be measures and avenues to meet such situations without allowing them to grow into international issues. The world body known as the UN was supposedly set up for that purpose, but does it really deliver the goods? Did or did not the Security Council approve the invasion of Iraq? Or did George Bush and took the law into their hands and carried on regardless? What did the UN do about it? Didn't it reluctantly go along with the US approving everything it did afterwards?

Cannot the international community afford something more genuine and more respectable? What is needed is a machinery or instrument that can handle all issue, with no pressure being used by the so-called big powers? Aren't there enough and more elder statesmen highly regarded by the world, who can be called upon to advice and counsel in situations where things are going out of control? I would not suggest men of the caliber of Tony Blair who was behind George Bush in the Iraqi invasion. There are men and women who do not make a noise, but are genuinely interested in world peace and respected by the people at the same time. Nelson Mandela may be too old, but there are who could be close to him.

Having learnt from the experience in the desert states, has the US now come closer to what the Buddha advised in diplomacy and negotiation? Myanmar is country well-known for its golden pagodas. With all the destruction and harassment it has preserved the doctrine of the Buddha with a large number of monks practicing the discipline taught by the teacher. Even the rulers cannot ignore the monks and their influence on the lay people. Was this the reason why the US turned to a more soccer and method of relating to, its rulers?

Whether this novel approach by the US is going to work is yet to be seen. We heard of the nominations being handed over b y the Aung Saan Souki for the forthcoming election. What results it will give too is yet to be seen. All what any sensible person can hope for is that this sets a precedent for all international problems, rather the solution of all international issues.

That will be a day to remember.

# අනන්තය



ආචාර්ය
වික්‍රමබාහු
කරුණාරත්න

පසුගිය දෙසැම්බර් 05 වැනිදා දෙහිවල ගල්කිස්ස මහ නගර සභා අය වැය විවාදයේ දී මන් මෙහෙම කිව්වා.

ගරු නගරාධිපතිතුමනි, අද දින විපක්ෂයේ එනම් එක්සත් ජාතික පක්ෂයේ නායිකාව ජයසිංහ මැතිනිය ඇතුළු සියළු දෙනාම අයවැයට පක්ෂ බව මට පෙනෙනව. ඒ සම්බන්ධව පක්ෂ වීමට තීන්දුවක් ගත් බව විපක්ෂ නායිකාව වන සුනේත්‍රා රණසිංහ මහත්මියත් පැවසුවා. නමුත් විපක්ෂය ලෙස සියළු දෙනාම සාකච්ඡා කර එසේ තීන්දුවක් ගත් බව මන් දන්නේ නෑ. මෙය එක්සත් ජාතික පක්ෂයේ තීන්දුවක් විය හැකියි. පෙරේදා එතුමිය මට කොටුවේ පැවැති උද්ඝෝෂණයක දී මුණ ගැසුණා. එතැනදී වත් මෙසේ තීන්දුවක් ගත් බව එතුමිය කිව්වේ නෑ.
(එහි දී අඩුපාඩුවක් සිදුවූ බවත් ඒ ගැන කණගාටුව ප්‍රකාශ කරන බවත් නාගරික මන්ත්‍රී රුවන් ලියනගුණවර්ධන මහත්මා පැවසීය)

දේශපාලන සිරකරුවන් වන ෆොන්සේකා මහත්මා ඇතුළු ද්‍රවිඩ සිරකරුවන් විශාල පිරිසක් නිදහස් කර ගැනීමේ උද්ඝෝෂණයක් පැවැත් වුනා. රටේ විශාල ප්‍රශ්න රාශියක් ඇති නිසා මේ සභාව තුලදී වුවත් එකඟතාවක් ඇති කර ගැනීමට හැකි නම් ඒ ගැනද උත්සාහක් දැරිය යුතු වෙනව. ඕනෑම පක්ෂයකට තමන්ට ස්වාධීන තීන්දු ගැනීමට අයිතියක් ඇති නමුත්, විපක්ෂය ලෙස එකට උද්ඝෝෂණය කරමින්සිටිනවා නම් අපි අතර අන්‍යෝන්‍ය සහයෝගීතාවක් ගොඩ නැගීමට හැකිද කියා සොයා බැලිය යුතුයි. කෙසේ වෙතත් සියළු දෙනාම සහයෝගය දෙන නිසාත් එසේම රාත්‍රී භෝජන සංග්‍රහයකටද ආරාධනා කර ඇති නිසාත් මාත් අය වැය ලේඛනයට සහයෝගය දීමට තීන්දු කලා.



මෙම වැඩසටහන්, අය වැය ලේඛණය ඉතාම හොඳින් පිළියෙල කර තිබෙනව. බොහෝ අවස්ථාවල සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා වලින් ඉදිරිපත්වන ලියවිලි වල වැරදි ඇති වෙනව. නමුත් මා මෙය කියවා බැලුවා. මෙහි වැරදි අඩුයි. ඉතාමත් හොඳින්, භාෂා තුනෙන්ම සකස් කර ඇති නිසා ඉතා වැදගත්. ඕනාම විදේශිකයෙකුට වුනත් කරගෙන යන වැඩ පිලිවෙල පෙන්වියහැකියි. නමුත් මෙහි ගරු නගරාධිපතිතුමාගේ කථාවසිංහලභාෂාවෙන් පමණක් ඇතිනිසා අඩු තරමේ ඉංග්‍රීසි භාෂාවෙනුත් එයතිබුණා නම් ඉතාමත් සුදුසු යි. භාෂා තුනෙන්ම වැඩ කිරීමේ වැඩ පිළිවෙලට අවතීර්ණ විය යුතු යි.
ඉතිහාසය ගත් කල නගර සභා ඇති වුයේ පාර්ලිමේන්තු ඇති වීමට පෙරයි. එම නිසා නගර සභා වල ව්‍යයස්ථා, ප්‍රජාතන්ත්‍රවාදී ජනතාව නියෝජනය කරන, ජනතාවගේ එදිනෙදා අවශයතාවයන් ප්‍රජාතන්ත්‍රවාදීව දෘෂ්‍යමාන වන ලෙස සාදා ඇති, අවුරුදු 300 ක් පමණ පැරණි සම්ප්‍රදායන් තුලින් පැවත එන ව්‍යවස්ථා බව මනා වැටහීමක් ඇති නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු අපට සිටිනව.
එසේම ඕනෑම පාලනයක රජෙකු හා පඬිවරයෙකු සිටින බව පැරණි පොත පතේ සඳහන් වෙනවා. චූලනී හා කේවට්ට මෙන්ම වේදේහ හා මහඖෂධ එදා හිටිය. අපට ඉන්නේ මේ යුගල වලින් කොයි එකද යන්න ගැටළුවක්. වුවමනාවට වඩා නිලධාරීන් පත් කර තිබූ යුගයක 16 වැනි චක්‍ර ලේඛයක් මගින් නිලධාරීන් අඩු කිරීමේ ක්‍රියා පටිපාටියකට අවතීර්ණ වී තිබුනා. එසේ කර තිබෙන්නේ එකම පුටුව භාර ගැනීමට දෙදෙනෙකු සිටින නිසා ය. මේ නීතිය නිසා නිලධාරියෙකු විශ්‍රාම ගිය විට ඒ සඳහා තවත් කෙනෙකු ලබාගැනීමට අප සටන් කලේ නැති නම් ඒ නිලය අහෝසි වන තත්ත්වයක් මතුවී තිබෙනවා. ඒ නිසා පාලනය විසින් නිරන්තරයෙන් සෝදිසියෙන් සිට තමන්ට අවශ්‍ය තනතුරු ටික හැම අවස්ථාවේ දී ම භාණ්ඩගාරයට දැනුම් දී ඒවා බේරා ගැනීමේ සටනක යෙදී සිටියේ නැති නම් ඒවා අහෝසි වෙනව. පසුගිය පාලන සමයන්හි මේ ගැන අවධානයෙන් නොසිටි නිසා අවශ්‍ය තනතුරු, අනුමත තනතුරු ලේඛණයෙන් අහෝසි වී ගොස් තිබෙන නිසා දැන් ඒවා නැවත ලබාගැනීමේ දී දුෂ්කරතාවයන්ට පත්ව තිබෙන බව කථාවන්ගෙන් පෙනී යනව.

සමහර නිල වලට කම්කරුවන් යොදා ඇති බව මේ කථා වලදී කියවුණු නමුත් ඇත්ත කථාව ඒක නොවෙයි. කම්කරු වැටුපට නිලධාරීන්ව පත් කර තිබ්මයි ඇත්ත. මේ අයට පුහුණුවක් නැති විය හැකි නමුත් උපාධිය තිබෙන අය මේ වැටුපට වැඩ කරනවා විය හැකියි. අපට රක්ෂාවකට ඇතුලත් කිරීමට හැක්කේ ඒ අඩු වැටුපට පමණක් නිසා මෙවැනි තත්ත්වයක් උදා වී තිබෙනවා. කෙසේ නමුත් මෙම ප්‍රශ්නය ඉතා බැරෑරුම් ප්‍රශ්නයක් වන අතර, අප කමිටු පවත්වා කෙතරම් තීන්දු ගත්තත් ඒවා ක්‍රියාත්මක කිරීමට නිලධාරීන් අවශ්‍යයි. නිලධාරීන් නොමැති නම් එම කටයුතු කරගෙන යාමට නොහැකි වෙනව.

එසේම ප්‍රාග්ධන යෝජනාවලින් ඉටුකර ගැනීමට හැකිවී තිබෙන්නේ 25% ක් පමණක් බව පේනව. එක් එක් යෝජනා ඉදිරිපත් කලත් ක්‍රියාත්මක නොකිරීම නිසා භාණ්ඩාගාරයට එම මුදල් නැවත ගිහින්තියෙනව. ඒ නිසා මන්ත්‍රීවරුන් වෙනුවෙන් එම ප්‍රාග්ධන මුදල් වෙන් කර තිබුණා නම් මන්ත්‍රීවරුන් මහන්සිවී තමන්ගේ නම ප්‍රසිද්ධ කර ගැනීමට හෝ ඒ වැඩ කටයුතු කරන නිසා මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත ක්‍රමයකට ඒ මුදල් ටික ලබා දෙන්නේ නම් ගැලපෙන ආයෝජනයකට යොමු කිරීමට හැකි වෙනව. ඒ ගැන කල්පනා කර බලන්න. අනෙක් කාරණය නගර සභාවේ වැඩ කටයුතුවලට හරස් වී වෙනත් දේවල් ඉහලින් පැමිණ ඒ සඳහා මුදල් වැය කිරීමක් සිදුවන බව කතා වුනා. අද ලෝකයේ නව ලිබරල්වාදී ආර්ථික බලවේග ක්‍රියාත්මක වෙනව. ලෝක බැංකුව හරහා ක්‍රියාත්මක වන්නේ ද එයයි. ඒ අනුව වෙන්නේ තමන්ගේ මහ පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ජනතාවගේ සුළු ව්‍යාපෘති කප්පාදු කිරීමයි.

අධ්‍යාපනය වේවා, සෞඛ්‍ය වේවා දුප්පතාගේ පැවැත්ම නැති කරමින් මෙම බලවේග එනවා. විශේෂයෙන් නගර සභාවක් වැනි ආයතනයක් ජනතාව නිරන්තරයෙන් සම්බන්ධ වන ආයතනයක්. ඒ බැවින් නගර සභා මගින් දුප්පතාගේ සහනශීලී යෝජනා ඇති වෙනව. එම යෝජනා කුඩුපට්ටම් කරමින් ඉහලින් පැමිණෙන යෝජනාක්‍රියාත්මක කිරීමට බලපෑම් පැමිණෙනවිට ඒවාට විරුද්ධව සටන් කල යුතුයි. එවැනි අරගලයක් මෙහි සිදුවී තිබෙනවා. මෙවැනි යෝජනා අනුව අධිවේගී මාර්ග ඉදිකරන අතර එම මාර්ගවල බල්ලන්, ඉබ්බන් මැරෙන නමුත් ඒවායේ ගමන් කරන්නේ කවුද කියා අප දන්නේ නැති අතර එවැනි මාර්ග ඉදිකිරීමේදී ගමේ තිබෙන කුඹුරු යටකරගෙන ගොස් ගමේ අයට අසාධාරණකම් සිදුවන බවත්, කුඹුරු හිමියන්ට මේ පැත්තේ සිට අනෙක් පැත්තට හරක් ටික ගෙන යාමට කිලෝ මීටර් 34 ක් යෑමට සිදුවී තිබෙනවා කියා විමල් වීරවංශ මහතා කියනව. සාමාන්‍ය මිනිසාගේ අයිතිවාසිකම් කුඩුපට්ටම් කරගෙන ලොකු අයට රේස් යාමට පාරවල් සාදන බව පෙනෙනව. එවැනි යුගයක අප සිටින බැවින් නගර සභාවක් විදියට අපට මේවා බලපානවා. නමුත් ඔබතුමා හැමවිටම සිටින්නේ දුප්පතුන්ගේ පැත්තේ බව කියන නිසා ගැටළුවක් ඇති වෙතැයි මා සිතන්නේ නෑ. ඔබතුමා කල සටන තුලත් විද්‍යාමාන වන ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනව. ලෝක බැංකුවෙන් ණය ගෙන යෝජනා ක්‍රියාත්මක කරන්නට යෑමේ දී ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනව. සාමාන්‍ය ජනතාවගේ සහයෝගය තිබෙන අපවැනි නියෝජිතයන් ඉදිරිපත් කරන යෝජනා යටකරගෙන යාමට විරුද්ධව සටන් කිරීමට සිදුවනවා. ඒ බව ඔළුවේ තබා ගෙන කටයුතු කරමින් අධිවේගී මාර්ග සෑදීම නතර කර මාතෘ සායනවල අහිංසක මව්වරුන්ට කිරිපැකට් එක වෙනුවෙන් ඔබතුමා කල සටන විශේෂයෙන් සම සමාජ සටනක් හැටියට මා සන්තෝෂයෙන් භාර ගන්නව.

එසේ ම අතිකාල දීමනාව හා වැටුප් සම්බන්ධව මෙහි කියැවුණු අතර සේවකයන් බලා සිටින්නේ අතිකාල හා වැටුප නියමිත වේලාවට ලබා ගැනීමටයි. ඒ බැවින් මීට අවුරුදු විස්සකට පෙර මෙවැනි තත්ත්වයක් නොතිබුනත්, රජයේ සේවකයාට මීට වඩා ශක්තිමත් තත්ත්වයක් තිබුණත්, අද ඒ අය අසරණ වී නියමිත වේලාවට වැටුප ලබා ගැනිමට නොහැකි වුවහොත් ණය කරුවන්ගෙන් සාක්කුවට යටවන තත්ත්වයක්ඇති වී තිබෙනවා. ඒ නිසා රජයේ සේවයේ ඉහල මට්ටම් පවා පඩි වැඩි කරන ලෙස උද්ඝෝෂණය කරනව. අතිකාල දීමනා වැනි දේවල් නියමිත වේලාවට ලබා දීමට කටයුතු කිරීමට යොමු විය යුතුයි.

ප්‍රදේශයේ කර්මාන්ත ගණනාවක් වැසි දිනවලදීජලයෙන් යට වන බවට දුරකතන ඇමතුම් කිහිපයක් ලැබුණා. මේ ප්‍රදේශයේ කාණුව කොතලාවල විශ්ව විද්‍යාලය හරහා තිබු නමුත් එම කාණුව හරහා සිමින්ති දමා වැලි ගෝනිවලින් වසා දමල. වැලි ගෝනි කොටසක් ඉවත් කල නමුත් දමා තිබෙන සියළු බාධක ඉවත් කර නොමැති නිසා නිසියාකාරව ජලය බැස යන්නේ නැහැ. එම නිසා කොතලාවල විශ්ව විද්‍යාලය සමඟ සාකච්ඡා කර එම ප්‍රශ්ණය විසඳීමට කටයුතු කිරීමට පියවර ගත යුතුයි. එසේම පසුගිය දිනක මලනල පද්ධතිය සම්බන්ධව ජලාපවාහන මණ්ඩලය සමඟ සාකච්ඡාවක් පැවැත්වූවා. එහිදී එම ආයතනය සමඟ එකඟතාවයකට ඒමට හැකි වුනා. එවැනි සාකච්ඡාවක් පැවැත්වීම සම්බන්ධව මා ඔබතුමාට ස්තූතිවන්ත වනවා. මේ ආකාරයටම කොතලාවලපුර විශ්ව විද්‍යාලය සමඟ සාකච්ඡා කර ඒ ආයතනයේ ප්‍රශ්නයත් ජනතාවගේ හා එම කර්මාන්තශාලාවල සේවකයන්ගේ ප්‍රශ්නයත් විසඳීමටකටයුතු කරන ලෙසට ඉල්ලා සිටිනවා. එසේම අද මෙවැනිසාකච්ඡාවක්පැවැත්වීමට ඉඩ දීම ගැන මා සන්තෝෂ වෙනවා. ඔබතුමාගේ භෝජන සංග්‍රහයකට ආරාධනා කර තිබෙන බැවින් අප කල්වේලා ඇතිව යා යුතු නිසා මාගේ කථාව අවසන් කරනවා.


## සියලුම ජෝතිශ්‍ය කටයුතු

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම, කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සීහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම.... දල, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.......*

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.subodha-inc.com.au
0420682644/ 0433536097
subodha.inc@email.com